දුරකථන/தொலைபேசி இல./Telephone Nos.

අමාත්‍යතුමා / அமைச்சர் / Minister: 2784832, Fax: 2784825

ලේකම් / செயலாளர் / Secretary: 2784812

කාර්යාලය / அலுவலகம் / Office: 2785141-50, Fax: 2784846

ඊමේල්/ஈ-மெயில்/E-mail : isurupaya@moe.gov.lk

ඔබේ අංකය / உமது இல. / Your No. ..................

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

"ඉසුරුපාය"
බත්තරමුල්ල.
'இசுருபாயா'
பத்தரமுல்ல.
"Isurupaya"
Battaramulla.

මගේ අංකය / எமது இல. / My No. ED/01/101/06/3/1

දිනය / திகதி / Date 2014.04. 04

**වක්‍රලේඛ අංකය - 11/2014**

සියලුම පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
අධ්‍යාපන අධ්‍යක්ෂ (ගණිත),
සියලුම කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම කොට්ඨාස අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම පළාත්/කලාප ගණිත විෂය භාර නියෝජ්‍ය/ සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
සියලුම ගණිත ගුරු උපදේශකවරුන් සහ
සියලුම විදුහල්පතිවරුන් වෙත,

## සමස්ත ලංකා පාසල් ගණිත තරගාවලිය

අංක 22/2013 දරණ 2013.05.21 දිනැති වාර්ෂික ජාතික ගණිත තරගාවලිය නමැති වක්‍රලේඛය මෙයින් අවලංගු කෙරෙන අතර 2014 වර්ෂයේ සිට සමස්ත ලංකා පාසල් ගණිත තරගාවලිය මෙම වක්‍රලේඛයේ විධි විධාන පරිදි පැවැත්විය යුතු වේ.

සෑම වසරක දී ම අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණිත ශාඛාවේ මූලිකත්වයෙන් පැවැත්වෙන සමස්ත ලංකා පාසල් ගණිත තරගාවලිය පහත සඳහන් පරිදි අංශ දෙකකින් සමන්විත වේ.

I. සමස්ත ලංකා පාසල් ගණිත දැනුම මිනුම තරගාවලිය

II. සමස්ත ලංකා පාසල් ගණිත නාට්‍ය තරගාවලිය

සමස්ත ලංකා මට්ටමේ තරග පවත්වන ආකාරයත්; පාසල්, කොට්ඨාස, කලාප සහ පළාත් මට්ටමේ තරග පැවැත්වීමෙන් අනතුරුව එක් එක් තරග ඉසව් සඳහා පළාත නියෝජනය කරන සිසු කණ්ඩායම් ඊට සහභාගි කරවිය යුතු ආකාරයත් පිළිබඳව මෙම වක්‍රලේඛයෙන් දැනුවත් කෙරේ.

## 1.0 සමස්ත ලංකා පාසල් ගණිත තරගාවලිය හැඳින්වීම

දිවයිනේ සියලු ම පාසල්වල ගණිත විෂයය හදාරන ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ දැනුම සහ කුසලතා සංවර්ධනය සඳහාත්, ඔවුන්ගේ නිර්මාණාත්මක හැකියා ප්‍රදර්ශනය සඳහාත් අවස්ථාව සැලසෙන පරිදි ගණිත දැනුම මිනුම තරගමාලාවක් සහ ගණිත නාට්‍ය තරගමාලාවක් වශයෙන් මෙම තරගාවලිය පහත සඳහන් පොදු අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණිත ශාඛාව විසින් 2011 වසරේ සිට පවත්වාගෙන යනු ලැබේ.

2 පිටුවට

## 1.1 සමස්ත ලංකා පාසල් ගණිත තරගාවලියේ පොදු අරමුණු

1. ගණිතය නීරස යැයි ඇතැම් සිසුන් තුළ ඇති ආකල්පය ඉවත් කර ගණිතය සතුටින් ඉගෙන ගත හැකි ප්‍රියජනක විෂයයක් කරවීම.

2. ගණිතය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට සමගාමී ව නිර්මාණාත්මක අධ්‍යයන අවස්ථා හඳුන්වා දීම සහ ඒවා මතු පරපුරට පවරා දීම.

3. සිසුන්ගේ පෞරුෂ වර්ධනය සඳහා රසඥතාවය, යහපත් ආකල්ප, කුසලතා සහ නිර්මාණාත්මක චින්තනය සංවර්ධනය කිරීම.

4. සියලුම සිසුන්ට විෂයය පරිබාහිරව ගණිත විෂයය සංවර්ධනය සඳහා යොමු වීමේ විකල්ප අවකාශ සැලසීම සහ ජය පරාජය උපේක්ෂා සහගතව විඳදරා ගැනීමට සිසුන් හුරු කරවීම.

## 2.0 සමස්ත ලංකා පාසල් ගණිත තරගාවලිය පිළිබඳ උපදෙස් සහ පොදු නීතිරීති

සමස්ත ලංකා පාසල් ගණිත තරගාවලිය, සමස්ත ලංකා පාසල් ගණිත දැනුම මිනුම තරගාවලිය සහ සමස්ත ලංකා පාසල් ගණිත නාට්‍ය තරගාවලිය යන තරගාවලි දෙකකින් සමන්විත ය. මෙම තරගාවලිය පිළිබඳව පොදු උපදෙස් අංක 2.1 ඡේදය යටතේ ද සමස්ත ලංකා පාසල් ගණිත දැනුම මිනුම තරගාවලිය පිළිබඳ උපදෙස් අංක 3 ඡේදය යටතේ ද සමස්ත ලංකා පාසල් ගණිත නාට්‍ය තරගාවලිය පිළිබඳ උපදෙස් අංක 4 ඡේදය යටතේ ද සවිස්තරව දක්වා ඇත.

අදාළ සමස්ත ලංකා පාසල් ගණිත තරගාවලි පැවැත්වෙන ස්ථාන සහ දින අධ්‍යාපන අමාත්‍යාංශයේ ගණිත ශාඛාව විසින් තීරණය කරනු ලැබේ. ඊට අදාළ විස්තර සහ උපදෙස් සමස්ත ලංකා තරග ආරම්භ කරන දිනට සිව් මසකට පෙර නිවේදනය කෙරේ.

### 2.1 පොදු උපදෙස්

2.1.1 සමස්ත ලංකා පාසල් ගණිත දැනුම මිනුම තරගාවලිය සඳහා සිංහල සහ දෙමළ භාෂා මාධ්‍ය වෙන් කිරීමකින් තොරව කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ ඉසව් දෙක යටතේ එක් ඉසව්වකින් කණ්ඩායමක් බැගින් පළාතකින් කණ්ඩායම් දෙකක් ඉදිරිපත් කළ යුතු වේ. මීට අමතරව සමස්ත ලංකා පාසල් ගණිත නාට්‍ය තරගාවලිය සඳහා කණිෂ්ඨ සහ ජ්‍යෙෂ්ඨ යන ඉසව් දෙක යටතේ ද, සිංහල සහ දෙමළ මාධ්‍ය යටතේ ද නාට්‍ය බැගින් වන සේ එක් පළාතකින් නාට්‍ය කණ්ඩායම් 4ක් බැගින් ඉදිරිපත් කළ යුතු වේ. එහි දී සමස්ත ලංකා තරගාවලිය සඳහා පළාත නියෝජනය කරන කණ්ඩායම්වල භාරකාරත්වය දරමින් පළාත් ගණිත විෂයය සම්බන්ධීකරණ නිලධාරි ඊට සහභාගී වීම අනිවාර්යය වේ.

2.1.2 සමස්ත ලංකා මට්ටමට ඉදිරිපත් කරන කණ්ඩායම් තෝරා ගැනීම සඳහා අදාළ පළාත තුළ මෙම තරගාවලියේ පොදු අරමුණු හා එක් එක් තරගාවලිය යටතේ වන සුවිශේෂී අරමුණුවලට ගැළපෙන පරිදි කොට්ඨාස, කලාප සහ පළාත් මට්ටමින් තරග සංවිධානය කළ යුතු ය. ඒ සඳහා කොට්ඨාස සහ කලාප මට්ටමේ තරග පළමුව පවත්වා ඉන් ජයග්‍රහණය ලබන කණ්ඩායම් පළාත් මට්ටමේ තරගය සඳහා ඉදිරිපත් කළ යුතු ය.

2.1.3 මීට අදාළ සියලුම කොට්ඨාස සහ කලාප තරග කලාප ගණිත විෂයය භාර නිලධාරි විසින් ද පළාත් තරග පළාත් ගණිත විෂයය සම්බන්ධීකරණ නිලධාරි විසින් ද සංවිධානය කළ යුතුය. තරගාවලියේ පොදු අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස කලාපයේ උපරිම පාසල් සංඛ්‍යාවක් තරගාවලියට ඉදිරිපත් කිරීමට කලාප ගණිත විෂයය භාර නිලධාරි විසින් ක්‍රියා කළ යුතු ය. එලෙස කලාපය විසින් හඳුනාගන්නා ලද පාසල්වල තරග කණ්ඩායම් පුහුණු කර ඉදිරිපත් කිරීමේ පූර්ණ වගකීම පාසල්වල විදුහල්පති වෙත පැවරෙන අතර ඊට අදාළ උපදේශනය ගණිත ගුරු උපදේශකවරුන් විසින් සැපයිය යුතු ය.

2.1.4 කොට්ඨාස සහ කලාප තරග කලාප අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහ පළාත් තරග පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ණ අධීක්ෂණය යටතේ අධ්‍යාපන අමාත්‍යාංශය මගින් නියම කර ඇති කාලසටහනෙහි අදාළ කාල සීමාව තුළ දී පවත්වා අවසන් කළ යුතු ය.

3 පිටුවට

2.1.5 කොට්ඨාස, කලාප සහ පළාත් මට්ටමේ සියලුම තරග ප්‍රතිඵල එම තරග පවත්වනු ලබන දිනයන්හි දී ම නිකුත් කළ යුතු ය. ලබාගත් සමස්ත ප්‍රතිඵල ලේඛනය සමග එක් එක් තරගාවලි සඳහා ප්‍රථම ස්ථාන ලබාගත් කණ්ඩායම් පිළිබඳ විස්තර පාසලේ නම, ලිපිනය,කොට්ඨාසය, කලාපය, පැහැදිලිව ලියා කලාප තරග අවසානයේ දී කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත යැවිය යුතු ය.

2.1.6 විනිශ්චය මණ්ඩලය දෙනු ලබන තීරණ කිසිදු ආකාරයකින් වෙනස් නොකළ යුතු ය. එක් එක් තරගාවලිය යටතේ විස්තර කෙරෙන ආකාරයට අනුව සෑම මට්ටමක දී ම ඒ ඒ තරග සඳහා විනිශ්චය මණ්ඩලයේ සංයුතිය තෝරා ගැනීම සිදු කළ යුතු ය. කොට්ඨාස හා කලාප මට්ටමේ තරග සඳහා විනිශ්චය මණ්ඩලය කලාප ගණිත විෂයය භාර නිලධාරි විසින් ද පළාත් මට්ටමේ තරග සඳහා විනිශ්චය මණ්ඩලය පළාත් ගණිත විෂයය භාර නිලධාරි විසින් ද පත් කළ යුතුය.

2.1.7 පළාත් තරග අවසානයේ දී සමස්ත ලංකා තරගය සඳහා සහභාගි වන කණ්ඩායම් පිළිබඳ තොරතුරු හා නිර්දේශය පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් **දී ඇති ආකෘතිවලට අනුව ම** (සමස්ත ලංකා පාසල් ගණිත දැනුම මිනුම තරගාවලිය සඳහා ආකෘති අංක 1 සහ සමස්ත ලංකා පාසල් ගණිත නාට්‍ය තරගාවලිය සඳහා ආකෘති අංක 2) සම්පූර්ණ කර අදාළ වසරේ අගෝස්තු මස 15 දිනට පෙර අධ්‍යාපන අධ්‍යක්ෂ, ගණිත ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල යන ලිපිනය වෙත එවිය යුතු ය. එසේ නිවැරදි ව නියමිත දිනයට පෙර අදාළ තොරතුරු නොඑවන තරග කණ්ඩායම්වලට සමස්ත ලංකා පාසල් ගණිත තරගාවලියට ඉදිරිපත්වීමට අවස්ථාව දෙනු නොලැබේ.

## 3.0 සමස්ත ලංකා පාසල් ගණිත දැනුම මිනුම තරගාවලිය

### 3.1 සමස්ත ලංකා පාසල් ගණිත දැනුම මිනුම තරගාවලියේ සුවිශේෂී අරමුණු

3.1.1.සුහග සිසුන් හඳුනාගෙන ජාතික හා ජාත්‍යන්තර තලයේ ගණිත ක්ෂේත්‍රයෙහි ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමේ ශක්‍යතා වර්ධනය කිරීම.

3.1.2.ගණිත විෂයය දැනුම සම්බන්ධව ගුරු සිසු දෙපිරිසගේ ම බුද්ධි කලඹන අවස්ථා ඇති කිරීම.

3.1.3.සිසුන් තුළ ඇති ගණිත විෂයයට අදාළ විභව්‍යතා එළිදැක්වීමට සහ ඇගයීමට අවකාශ සැලසීම.

### 3.2 සමස්ත ලංකා පාසල් ගණිත දැනුම මිනුම තරගාවලිය පැවැත්වීමේ ක්‍රමවේදය හා තරග කොන්දේසි

#### 3.2.1. තරග ඉසව්

කණිෂ්ඨ අංශය හා ජ්‍යෙෂ්ඨ අංශය වශයෙන් වෙන වෙනම තරග ඉසව් දෙකක් පැවැත්වේ. නමුත් සිංහල හා දෙමළ මාධ්‍ය වශයෙන් ඉසව් වෙන් නොකෙරෙන අතර කිසියම් ඉසව්වක් නියෝජනය කිරීමට එම මාධ්‍ය දෙකෙහි ම ශිෂ්‍යයන්ට අවකාශ ඇත.

#### 3.2.2. සහභාගිත්වය

| තරග අංශය | ඉදිරිපත්වන කණ්ඩායමට අයත් තරගවදින සිසුන් ගණන | සිසුන් අයත් ශ්‍රේණි | එක් එක් ශ්‍රේණියෙන් කණ්ඩායමට අයත් සිසුන් ගණන | ඉදිරිපත්වන කණ්ඩායමට අයත් ආදේශක සිසුන් ගණන |
|---|---|---|---|---|
| කණිෂ්ඨ | 6 | 6 | 2 | 1 |
| | | 7 | 2 | 1 |
| | | 8 | 2 | 1 |
| ජ්‍යෙෂ්ඨ | 6 | 9 | 3 | 1 |
| | | 10 | 3 | 1 |

වගු අංක 1 - එක් එක් ශ්‍රේණි යටතේ ගණිත දැනුම මිනුම තරග ඉසව් සඳහා සිසු සහභාගිත්වය

4 පිටුවට

- කොට්ඨාස මට්ටමේ ගණිත දැනුම මිනුම තරගාවලිය සඳහා පාසල් නියෝජනය කරමින් කණ්ඩායම් ඉදිරිපත් වුව ද කලාප, පළාත් හා සමස්ත ලංකා මට්ටමේ ගණිත දැනුම මිනුම තරගාවලිය සඳහා එක් පාසලකට සීමා නොවී කොට්ඨාස / කලාප / පළාත් නියෝජනය කරන කණ්ඩායමක් වශයෙන් ඉහළ ලකුණු ලද සිසුන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් තරගයට ඉදිරිපත් කළ යුතු ය. සෑම තරග අදියරයක් ආරම්භයේ දී ම අවශ්‍ය පරිදි ආදේශක සිසුන් ද යොදවා ගනිමින් තරගවදින කණ්ඩායම තෝරා ඉදිරිපත් කිරීමේ වගකීම කලාප / පළාත් ගණිත විෂයය භාර නිලධාරින් විසින් දැරිය යුතු ය.

- සමස්ත ලංකා තරගාවලියට කණ්ඩායම් ඉදිරිපත් කිරීමේදී ඊට අයත් සිසුන් අදාළ වර්ෂයේ දී වගු අංක 01 පරිදි නියමිත ශ්‍රේණියේ ඉගෙනුම ලබන්නන් බවට අදාළ විදුහල්පති විසින් සහතික කළ යුතුය. තවද විදුහල්පති විසින් සහතික කරන ලද ඡායාරූපයක් බැගින් ද ඉදිරිපත් කළ යුතු ය.. එම සහතිකය සමග ආදේශක සිසුන්ද ඇතුළුව <u>තරග වදින කන්ඩායමට අයත් සිසුන්ගේ නාම ලේඛනය</u> පළාත් ගණිත විෂයය සම්බන්ධීකරණ නිලධාරී නිල මුද්‍රාව හා අත්සන සහිතව විනිශ්චය මණ්ඩලය වෙත තරගය ආරම්භවීමට පෙර භාර දීම මගින් තරගාවලියට සහභාගී වන්නන් 2.1.7 ඡේදයේ උපදෙස් පරිදි පළාත විසින් නිර්දේශ කරනු ලැබූ කණ්ඩායම ම බව තහවුරු කළ යුතු වේ. කණ්ඩායමක නිර්දේශිත නාම ලේඛනය විනිශ්චය මණ්ඩලය විසින් පිළිගනු ලබන සාධාරණ නොවැලැක්විය හැකි හේතුවක් මත වෙනස් කිරීමට සිදු ව ඇති අවස්ථාවල දී ඒ බව ද ඉහත තහවුරු කිරීමේ දී සනාථ කළ යුතු වේ. .

## 3.2.3. ජාතික මට්ටමේ තරග පැවැත්වෙන ආකාරය හා අදාළ කොන්දේසි

### 3.2.3.1. තරගාවලිය පැවැත්වෙන ආකාරය

සමස්ත ලංකා ගණිත දැනුම මිනුම තරගාවලියෙහි ජාතික මට්ටමේ තරග අදියර තුනකින් සමන්විත වේ.ඉන් එක් එක් අදියර මගින් කණ්ඩායම් තෝරා ගන්නා ආකාරය මතු දැක්වේ.

අදියර 01

- පළමු අදියර වශයෙන් ඉසව්වකට පළාත් 9යෙන් පළාත් කණ්ඩායම් 8 ක් පමණක් තෝරාගැනීම සඳහා ශ්‍රේණි මට්ටමට අනුව ප්‍රශ්න 10කින් සමන්විත, කාලය මිනිත්තු 15ක් වූ ලිඛිත පරීක්ෂණයක් බැගින් පැවැත් වේ. අඩු ම ලකුණු ලබාගන්නා කණ්ඩායම තරගාවලියෙන් ඉවත් කෙරේ. ( මෙම තේරීම් තරගයේ ලකුණු අවසාන තරගයට අදාළ නොවේ.)

අදියර 02

- ඉතිරිවන කණ්ඩායම් අට අවරෝහණ ලකුණු පෙළ ගැස්වීමට අනුව 1 සිට 8 දක්වා ස්ථාන අංක කර (1,5) ; (2,6) ; (3,7) සහ (4,8) වශයෙන් කණ්ඩායම් යුගල් කිරීමෙන් දෙවන තරග අදියරෙහි වට දෙකකින් යුත් පළමු කොටස එකම විටෙක ස්ථාන හතරක දී පැවැත්වේ. එහි දී කණ්ඩායම් ලබා ගන්නා ලකුණු තරා කිරීම අනුව නැවත ඉහත ආකාරයට ම යුගල් කර එම අදියරේ වට දෙකකින් යුත් දෙවන කොටස එකම විටෙක ස්ථාන හතරක දී පැවැත්වේ. පළමු හා දෙවන කොටස් දෙකෙහි ම ලකුණු එකතු කොට තරා කිරීමෙන් අනතුරුව වැඩිම ලකුණු ලබා ගන්නා කණ්ඩායම් හතර, තුන්වන අදියර සඳහා තෝරා ගනු ලැබේ.

අදියර 03

- දෙවන තරග අදියරේ ලකුණු තරා කිරීම අනුව (1,3) (2,4) කණ්ඩායම් අතර තෙවන අදියරේ තරග එකම විටෙක ස්ථාන දෙකක දී පැවැත්වේ. එහි දී ජයග්‍රාහී කණ්ඩායම් දෙක අතර තරගයෙන් සමස්ත ලංකා ගණිත දැනුම මිණුම තරගාවලියේ පළමුවන හා දෙවන ස්ථාන ද පරාජය වූ කණ්ඩායම් දෙක අතර තරගයෙන් තුන්වන ස්ථානය ද තෝරා ගනු ලැබේ.

5 පිටුවට

**3.2.3.2 ඉහත අදියර යටතේ තරගය පැවැත්විය යුතු ආකාරය හා ලකුණු පටිපාටිය**

- තරගය සඳහා කණ්ඩායමේ ළමුන් පහළ ශ්‍රේණියේ සිට ඉහළ ශ්‍රේණියට සිටින ආකාරයට අසුන්ගන්වනු ලැබේ. අදාළ තරගකරුවන්ට ප්‍රශ්න ඉදිරිපත් කරනුයේ පහළ ශ්‍රේණියේ සිට ඉහළ ශ්‍රේණිය දක්වා පිළිවෙලට ය.

- එක් තරග අදියරක දී එක් එක් ශ්‍රේණියකට ගැළපෙන ආකාරයට එක් වටයකට එක් පිළකට ප්‍රශ්න 6ක් බැගින් ඉදිරිපත් කෙරනු ඇත. එක් තරග වාරයක් එවැනි වට දෙකකින් යුක්ත වේ.

- ප්‍රශ්න තෝරාගැනීම කුසපත් ඇදීමෙන් සිදුකරනු ලැබේ.

- මුලින් ම ප්‍රශ්නය යොමු කරන කණ්ඩායම කාසියේ වාසිය උරගා බැලීමෙන් තීරණය කෙරෙන අතර දෙවන වටයේ දී අනෙක් පිළට මුල් වාරය හිමිවේ.

- එක් ප්‍රශ්නයක් එක් මාධ්‍යකින් දෙවරක් පමණක් කියවනු ලැබේ. [අවශ්‍යතාවය අනුව ප්‍රශ්න මාධ්‍ය දෙකෙන් ම (සිංහල/දෙමළ) ඉදිරිපත් කෙරේ. ]

- අදාළ තරගකරුට පිළිතුරු දීම සඳහා කාලය තත්පර 90ක් තුළ උත්සාහයන් දෙකකට අවසර ඇත. නිවැරදි පිළිතුරට ලකුණු 10 ක් ලැබේ. පිළිතුර වැරදි නම් එම පිළේ ම අදාළ ශ්‍රේණියේ වෙනත් අයෙකුට යොමු කෙරේ. කාලය තත්පර 15 කි. එක් උත්සාහයකට පමණක් අවසර ලැබේ. පිළිතුර නිවැරදි නම් ලකුණු 5ක් හිමි වේ. <u>මෙම දෙවන අදියරෙහි දී පිළිතුර වැරදි වුවහොත් එය ප්‍රතිවිරුද්ධ පිලට ඉදිරිපත් නොකෙරේ</u>.නමුත් තුන්වන අදියරෙහි දී පළමු පිළෙහි පිළිතුර වැරදි නම් ප්‍රශ්නය ප්‍රතිවිරුද්ධ පිළට යොමු කෙරේ. කාලය තත්පර 15 කි. එක් උත්සාහයක දී පිළිතුර නිවැරදි නම් ලකුණු 5ක් හිමි වේ.

- පහළ ශ්‍රේණියේ තරගකරුවෙකුට යොමු කරන ප්‍රශ්නයක් සඳහා කිසිදු විටෙක ඉහළ ශ්‍රේණියේ තරගකරුවෙකුගේ පිළිතුර පිළිනොගැනේ. නමුත් ඉහළ ශ්‍රේණියේ තරගකරුවෙකුගේ ප්‍රශ්නයකට පහළ ශ්‍රේණියේ තරගකරුවෙකුගේ පිළිතුර පිළිගැනේ.

- වට දෙක අවසානයේ කණ්ඩායම් දෙක ම සම ලකුණු ලබා ඇත්නම් දිනුම ලබා දීම සඳහා වරකට ප්‍රශ්න යුගලය බැගින් අවම ප්‍රශ්න යුගල සංඛ්‍යාවක් ඉහළම ශ්‍රේණියේ තරග කරුවන්ට ඉදිරිපත් කෙරේ.

- පළාත් ගණිත විෂයය සම්බන්ධීකරන නිලධාරී විසින් නම් කරනු ලබන නිලධාරීන් දෙදෙනෙකු බැගින් තරග නිරීක්ෂණය සඳහා සහභාගී කරවිය හැකිය.

**3.2.3.3 තරගයට ඉදිරිපත්වීම හා විනිශ්චයට අදාළ කොන්දේසි**

- සහභාගීත්වයට අදාළ 3.2.2. ඡේදයට අනුකූලව සහතික කරන ලද නාමලේඛනයට අයත් කණ්ඩායම පමණක් සමස්ත ලංකා තරගාවලිය සඳහා පළාත වෙනුවෙන් ඉදිරිපත් කරවිය යුතුය.

- තරගකරුවන් පාසල් නිල ඇඳුමෙන් තරගයට සහභාගී විය යුතුය.

- විනිශ්චය මණ්ඩලය තිදෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර ඔවුන් ගණිත විෂයය ක්ෂේත්‍රයේ ප්‍රවීණයන් විය යුතු ය. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

6 පිටුවට

### 3.2.4 සමස්ත ලංකා පාසල් ගණිත දැනුම මිනුම තරගාවලියේ තරග කාලසටහන

පහත සඳහන් කාල පරාසයන් නොඉක්මවන පරිදි අදාළ තරග පවත්වා නිම කළ යුතු ය.

| තරගාවලිය | කලාප මට්ටම | පළාත් මට්ටම | සමස්ත ලංකා මට්ටම |
|---|---|---|---|
| ගණිතය දැනුම මිනුම | මැයි/ජූනි | ජූනි/ජූලි | සැප්තැම්බර් |

වගු අංක 2 - සමස්ත ලංකා පාසල් ගණිත දැනුම මිනුම තරගාවලි පැවැත්වෙන කාල පරාසය

### 3.2.5 සමස්ත ලංකා පාසල් ගණිත දැනුම මිනුම තරගාවලියේ ජයග්‍රාහී කණ්ඩායම් සඳහා සහතික හා පදක්කම් පිරිනැමීම.

- පළමු, දෙවන සහ තෙවන ස්ථාන ලබාගන්නා කණ්ඩායම්වල ආදේශක සිසුන් ඇතුළු සියලු තරගකරුවන් සඳහා සහතික පත්‍රය බැගින් ද, එම එක් එක් කණ්ඩායමට අදාළ ජයග්‍රහණ සංකේතවත් කෙරෙන පදක්කම බැගින් ද ප්‍රදානය කරනු ලැබේ.
- ජාතික මට්ටමේ තරගයේ අදියර දෙක සහ තුනෙහි දී ලබා ගන්නා ලකුණුවල එකතුවෙන් කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ අංශයන්හි වැඩිම ලකුණු ලබා ගන්නා තරගකරුවන් තිදෙනා බැගින් තෝරා ඔවුන්ට විශිෂ්ඨ කුසලතා සහතික බැගින් පිරිනමනු ලැබේ.
- සමස්ත ලංකා පාසල් ගණිත තරගාවලිය සඳහා සහභාගි වූ පළමු දෙවන හා තෙවන ස්ථාන නොලත් සෙසු කණ්ඩායම් නියෝජනය කළ ආදේශක සිසුන්ද ඇතුළත් සියලු තරගකරුවන්ට සහභාගිත්ව සහතිකයක් බැගින් පිරිනැමේ.

## 4.0 සමස්ත ලංකා පාසල් ගණිත නාට්‍ය තරගාවලිය

### 4.1. සමස්ත ලංකා පාසල් ගණිත නාට්‍ය තරගාවලියේ සුවිශේෂී අරමුණු

4.1.1. ගණිත සංකල්ප හා තේමා පාදක කර ගනිමින් ගණිතය ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීමට පෙළඹවීම.

4.1.2. සතත අභ්‍යාසයේ යෙදීම සහ ප්‍රාසාංගිකව ඉදිරිපත් කිරීම තුළ අසීරු ගණිත සංකල්ප පහසුවෙන් තහවුරු කිරීමේ නව ක්‍රමවේදයන් හඳුන්වා දීම.

4.1.3. නිදහස් සෞන්දර්යාත්මක පසුබිමක් තුළ රසවත්ව, විනෝදජනකව, සාමූහිකව ගණිතය ඉගෙනීමට සිසුන් පෙළඹවීම.

4.1.4. ගුරු භවතුන් හා සිසුන් නිර්මාණකරණයට පොළඹවමින් ඔවුන්ගේ ගණිත නිර්මාණ කුසලතා වර්ධනය සහ ප්‍රතිභා ශක්තිය උද්දීපනය කිරීම.

4.1.5. ගණිත සංකල්ප සිසුන් තුළ තහවුරු කරවීමට විවිධ නිර්මාණාත්මක විකල්ප ක්‍රම යොදා ගැනීමට ගුරුවරුන් පෙළඹවීම.

### 4.2. සමස්ත ලංකා පාසල් ගණිත නාට්‍ය තරගාවලිය පැවැත්වීමේ ක්‍රමවේදය හා තරග කොන්දේසි

### 4.2.1 තරග ඉසව්

**කණිෂ්ඨ** අංශය සහ ජ්‍යෙෂ්ඨ අංශය වශයෙන් වෙන වෙන ම ද, සිංහල මාධ්‍ය සහ දෙමළ මාධ්‍ය වශයෙන් වෙන වෙන ම ද වන සේ ඉසව් 4ක් යටතේ තරග පැවැත්වේ.

7 පිටුවට

### 4.2.2 සහභාගිත්වය

| තරග අංශය / මාධ්‍ය | කණිෂ්ඨ අංශය සඳහා ඇතුළත් ශ්‍රේණි | ජ්‍යෙෂ්ඨ අංශය සඳහා ඇතුළත් ශ්‍රේණි |
|---|---|---|
| ගණිත නාට්‍ය සිංහල මාධ්‍ය | 9 හා ඊට පහළ ශ්‍රේණි | 13 හා ඊට පහළ ශ්‍රේණි |
| ගණිත නාට්‍ය දෙමළ මාධ්‍ය | 9 හා ඊට පහළ ශ්‍රේණි | 13 හා ඊට පහළ ශ්‍රේණි |

වගු අංක 3 - එක් එක් ශ්‍රේණි යටතේ ගණිත නාට්‍ය තරග ඉසව් සඳහා සිසු සහභාගිත්වය

4.2.2.1 සමස්ත ලංකා තරගයට ඉදිරිපත් කරන නාට්‍ය කණ්ඩායමේ උපරිම සංඛ්‍යාව සිසුන් 25කි.මින් නාට්‍ය රංගනයට එක් ඉසව්වක් සඳහා සහභාගි විය යුතු සාමාජිකයින් උපරිම සංඛ්‍යාව 15 විය යුතු ය. ඒ සඳහා වගු අංක 3 පරිදි පාසල් දරුවන් පමණක් තෝරාගත යුතු ය.

(සැ.යු - කිසිඳු ශිෂ්‍යයකුට කණිෂ්ඨ හා ජ්‍යෙෂ්ඨ කණ්ඩායම් දෙකටම සහභාගී විය නොහැක.)

- රංගනයට අමතරව පසුබිම් ගායනය, වාදනය සපයන්නේ නම් ඒ සඳහා අමතර සාමාජිකයින් උපරිම ව 10ක් සහභාගි කළ හැකි ය. එනම් රංගනයට හැර ආනුශංගික (පසුබිම් ගායනය හා වාදනය...) අංග සඳහා සහභාගි වීමේ දී කණිෂ්ඨ ජ්‍යෙෂ්ඨ සීමාව නොතකා 6-13 ශ්‍රේණිවල සිසු දරුවන්ගේ සහ ඊට අමතරව එම පාසලෙහි ගුරු භවතුන්ගේ සහභාගිත්වය ලබා ගත හැකි ය. ආනුශංගික අංග සඳහා තම අධ්‍යාපන කලාපය තුළ පිහිටි රජයේ වෙනත් පාසල්වල ගුරුභවතුන්ගේ සහභාගීත්වය ද ලබාගත හැකි ය. මෙලෙස රංගනයට අමතරව සහභාගීවන්නන් 10 දෙනා අතර සිටිය හැකි ශිෂ්‍ය නොවන සාමාජික සංඛ්‍යාවේ උපරිමය 4 ඉක්මවිය හැකි නොවේ.

4.2.2.2 සමස්ත ලංකා මට්ටම දක්වා සියලුම අදියරයන්හි දී ඉදිරිපත්වන සෑම කණ්ඩායමක් ම **කිසියම් පාසලකට අයත් ශිෂ්‍ය කණ්ඩායමක් ලෙස** තරගයට ඉදිරිපත් විය යුතු ය.

4.2.2.3 කණ්ඩායම සඳහා සහභාගි වන සෑම සිසු සිසුවියක් ම පාසලේ අදාළ ශ්‍රේණියෙහි ඉගෙනුම ලබන බවට විදුහල්පති විසින් සහතික කළ යුතු වේ. එම සහතික සමග තරග වදින කණ්ඩායමට අයත් ( නාට්‍ය රංගනයට හා රංගනයට අමතරව සහභාගීවන) සියලුම සිසුන් ඇතුළත් නාමලේඛනය පළාත් ගණිත විෂයය සම්බන්ධීකරණ නිලධාරී විසින් නිල මුද්‍රාව යොදා අත්සන් කර සමස්ත ලංකා තරග ආරම්භවීමට පෙර විනිශ්චය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම මගින් තරගාවලියට සහභාගි වන්නන් 2.1.7 ඡේදයෙහි උපදෙස් පරිදි පළාත විසින් නිර්දේශ කරනු ලැබූ කණ්ඩායම ම බව තහවුරු කළ යුතු වේ. නිර්දේශිත කණ්ඩායමේ සංයුතියෙහි වෙනස් කිරීමක් විනිශ්චය මණ්ඩලය විසින් ද පිළිගනු ලබන සාධාරණ නොවැලැක්විය හැකි හේතුවක් මත සිදු ව ඇති අවස්ථාවක දී ඒ බව ඉහත තහවුරු කිරීමේදී ම සනාථ කළ යුතු වේ.

### 4.2.3 තරග පැවැත්වීමේ ක්‍රමවේදයට අදාළ කොන්දේසි

**4.2.3.1.** සහභාගිත්වයට අදාළව 4.2.2 ඡේදයට අනුකූලව සහතික කරන ලද නාමලේඛන සමස්ත ලංකා තරගාවලිය සඳහා නියමිත පරිදි ඉදිරිපත් කළ යුතු අතර එසේ නොකරන කණ්ඩායම් සඳහා තරගයට සහභාගීවීමට අවස්ථාවක් දෙනු නොලැබේ.

**4.2.3.2.** නාට්‍යයේ මූලික හරය ගණිත විෂයයට අදාළ සංකල්ප ඔස්සේ ගොඩනැගී තිබිය යුතු ය. තවද 2.1.7 ඡේදයෙහි උපදෙස් පරිදි ආකෘති අංක 2 සම්පූර්ණ කර ඉදිරිපත් කිරීමේ දී මේ බව සංක්ෂිප්ත සටහන් මගින් තහවුරු කළ යුතු වේ.

**4.2.3.3.** නාට්‍ය රඟ දක්වන සම්පූර්ණ කාලය මිනිත්තු 20ට වඩා නොවැඩි විය යුතු අතර මිනිත්තු 15කට වඩා නොඅඩු විය යුතු ය.මෙම සීමාව තුළ නොවන ඉදිරිපත් කිරීම් සඳහා "කොන්දේසිවලට අනුකූලවීම" වෙනුවෙන් හිමිවන ලකුණු ප්‍රමාණය අහිමි වේ. කාලය ඉක්ම වූ තැන පටන් කෙරෙන රඟ දැක්වීම් ඇගයීමට ලක් නොකෙරේ.

8 පිටුවට

**4.2.3.4.** සියලුම තරග ඉසව්වල දී සිසු සිසුවියන් සැරසී සිටින ඇඳුම් පැළඳුම්, පාසල් පද්ධතියට සහ දේශීය හර පද්ධතීන්ට ගැළපෙන අයුරින් සකස් විය යුතු ය. ඒවා එම සිසු සිසුවියන්ගේ ආත්ම ගෞරවය සුරැකෙන, විශේෂයෙන් ම සදාචාර සම්පන්න රංගන ශෛලීන්ට ගැළපෙන ඒවා විය යුතු ය. අනවශ්‍ය ආකාරයෙන් අඟපසඟ නිරාවරණය නොවන ලෙසට ඒවා නිර්මාණය වී තිබිය යුතු ය. කිසිදු ආගමකට, ජාතියකට, පුද්ගලයෙකුට අපහාසයක්, අපහසුතාවයක් නොවන අයුරින් සදාචාරයට පටහැනි නොවන ඇඳුම්, දෙබස් නිර්මාණය විය යුතු ය. එසේ නොවුවහොත් එම කණ්ඩායම තරගයෙන් ඉවත් කිරීමට හේතුවක් වනු ඇත. ඉහත කරුණු පිළිබඳ පූර්ණ වගකීම අදාළ විදුහලේ විදුහල්පති විසින් දැරිය යුතු වේ.

**4.2.3.5.** කිසියම් කලාපයකින් සිංහල මාධ්‍යය හෝ දෙමළ මාධ්‍යය හෝ කණ්ඩායම් එකකට වඩා ඉදිරිපත් නොවන අවස්ථාවල දී ඉදිරිපත් වන කණ්ඩායම නිතරගයෙන් පළාත් මට්ටමේ තරගය සඳහා ඉදිරිපත් කළ යුතුය.

**4.2.3.6.** සමස්ත ලංකා මට්ටමේ දී විනිශ්චය මණ්ඩලය පස්දෙනෙකුගෙන් සමන්විත විය යුතු අතර එය ගණිතය විෂයය පිළිබඳව ප්‍රවීණයන් තිදෙනෙකු හා නාට්‍ය කලාව පිළිබඳ ප්‍රවීණයන් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතු වේ. විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වේ.

### 4.2.4 සමස්ත ලංකා පාසල් ගණිත නාට්‍ය තරගාවලියේ ඇගයීම

පහත නිර්ණායක යටතේ නාට්‍ය නිර්මාණ ඇගයීමට ලක්කෙරෙනු ඇත.

- නාට්‍ය නිර්මාණය නිවැරදි ගණිත සංකල්ප මත ගොඩනැගුණු සංදර්භයක් ඔස්සේ ඉදිරිපත් කිරීම. - (ලකුණු 30)
- එම ගණිත සංකල්ප පිළිබඳ පැහැදිලි අවබෝධයක් ඇති වන සේ නමුත් ගණිත පාඩමක් නොවන සේ නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීම. - (ලකුණු 30)
- නාට්‍ය අංග හා රංගනයේ මනා ප්‍රාසාංගිකත්වය - (ලකුණු 20)
- අනෙකුත් ආනුෂංගික අංග නාට්‍යයේ සාර්ථකත්වයට දායකවීම - (ලකුණු 10)
- නාට්‍යයේ සමස්ත ඒකාබද්ධතාව හා තරග කොන්දේසිවලට අනුකූල වීම. - (ලකුණු 10)

එකතුව - ලකුණු 100

### 4.2.5 සමස්ත ලංකා පාසල් ගණිත නාට්‍ය තරගාවලියේ තරග කාලසටහන

| තරගාවලිය | කලාප මට්ටම | පළාත් මට්ටම | සමස්ත ලංකා මට්ටම |
|---|---|---|---|
| ගණිත නාට්‍ය සිංහල මාධ්‍ය<br>ගණිත නාට්‍ය දෙමළ මාධ්‍ය | මැයි/ ජූනි | ජූනි/ජූලි | ඔක්තෝබර් |

වගු අංක 4 - සමස්ත ලංකා පාසල් ගණිත නාට්‍ය තරගාවලි පැවැත්වෙන කාල පරාසය

9 පිටුවට

**4.2.6 සමස්ත ලංකා පාසල් ගණිත නාට්‍ය තරගාවලියේ ජයග්‍රාහී කණ්ඩායම් සඳහා සහතිකපත් හා කුසලාන පිරිනැමීම.**

- පළමු, දෙවන හා තෙවන ස්ථාන ලබාගත් කණ්ඩායම්වල රංගනයට සහ ආනුශංගික අංග සඳහා සහභාගි වූ සියලු සාමාජිකයින් සඳහා සහතික පත්‍රය බැගින් ද එම එක් එක් කණ්ඩායම සඳහා අදාළ ජයග්‍රහණය සංකේතවත් කෙරෙන කුසලානය බැගින් ද ප්‍රදානය කරනු ලැබේ.

- සමස්ත ලංකා පාසල් ගණිත නාට්‍ය තරගාවලිය සඳහා සහභාගි වූ සෙසු කණ්ඩායම්වල සියලු සාමාජිකයින් සඳහා සහභාගිත්ව සහතිකයක් බැගින් හිමිවේ.

## 5.0 සමස්ත ලංකා පාසල් ගණිත තරගාවලිය සඳහා ආහාර පාන සහ නවාතැන් පහසුකම්

සමස්ත ලංකා මට්ටමේ තරග සඳහා සහභාගි වන කණ්ඩායම්වල සාමාජිකයින් සහ ඔවුන් භාරව පැමිණෙන ගුරුභවතුන් සහ නිලධාරින් සඳහා තම කණ්ඩායමට අදාළ තරග පැවැත්වෙන දිනයන්හි දි හා ඊට පෙර දින පමණක් ආහාර පාන සහ නවාතැන් පහසුකම් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් සපයනු ලැබේ.

## 6.0 පළාත් තරග සංවිධානය හා ප්‍රතිපාදන

මෙම තරග පැවැත්වීමේ ප්‍රධාන අරමුණ වන්නේ ගණිත විෂයය ප්‍රියජනක විෂයයක් බවට පත් කර සිසු අභිප්‍රේරණය මගින් සිසුන්ගේ ගණිතය සාධන මට්ටම ඉහළ නැංවීම වන බැවින් පළාතේ ගණිත විෂයය සංවර්ධන ඉලක්කවලට අනුකූල වන පරිදි සැලසුම් සහගතව සහ මනා නියාමනයකින් යුතුව මෙම තරගාවලිය සාර්ථක ලෙස සංවිධානය කිරීම සඳහා පළාත් අධ්‍යාපන ලේකම්ගේ සහ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ පූර්ණ අනුග්‍රහය අවශ්‍ය පරිදි ලබා දිය යුතු වේ.

කලාප මට්ටමින් සහ පළාත් මට්ටමින් තරග සංවිධානය හා පැවැත්වීමත් සමස්ත ලංකා මට්ටමේ තරගය සඳහා කණ්ඩායම් ඉදිරිපත් කිරීමත් සඳහා අවශ්‍ය ප්‍රතිපාදන පළාතේ විෂයය සංවර්ධනය සඳහා වෙන් ව ඇති ප්‍රතිපාදනවලින් සලසාගත යුතු වේ.

මෙම තරග සඳහා ඉදිරිපත් වන සියලුම තරගකරුවන් සහ ඔවුන් සමඟ සම්බන්ධවන අනෙකුත් පාර්ශවකරුවන් තරගාවලියේ සෑම අවස්ථාවක දී ම අදාළ පරිදි මෙම චක්‍රලේඛයේ සඳහන් නියමයන්ට යටත්ව කටයුතු කිරීමටත්, විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසාන තීරණය වශයෙන් පිළිගැනීමටත් එකඟ විය යුතු ය.

**මෙම චක්‍රලේඛයෙහි දක්වා ඇති වගන්ති හා සීමාවන් එකකට හෝ කිහිපයකට හෝ පටහැනිව කටයුතු කොට ඇති බව තරගාවලිය අතරතුර හෝ ඉන් අනතුරුව අනාවරණය වුවහොත් එම කණ්ඩායම සමස්ත ලංකා තරගාවලියේ කිසිඳු ජයග්‍රහණයකට හිමිකම් නොලබන්නන් සේ සලකනු ලැබේ. ඒවැනි අවස්ථාවලදී විනයානුකූල පියවර ගැනීම ඇතුළු අදාළ වෙනත් තීරණ ගැනීමේ බලය අධ්‍යාපන අමාත්‍යාංශය සතු වේ.**

**අනුර දිසානායක**
**ලේකම්**
අධ්‍යාපන අමාත්‍යාංශය.
2014.04. .

පිටපත් : 01.විගණකාධිපති
02. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය
03. අතිරේක ලේකම් (අධ්‍යාපන ගුණාත්මක සංවර්ධන) -අධ්‍යාපන අමාත්‍යාංශය
04. අතිරේක ලේකම්( ප්‍රතිපත්ති සැළසුම් හා කාර්යසාධන සමාලෝචන )-අධ්‍යාපන අමාත්‍යාංශය
05. ප්‍රධාන ගණකාධිකාරි - අධ්‍යාපන අමාත්‍යාංශය
06. අධ්‍යාපන අධ්‍යක්ෂ (සැළසුම්) - අධ්‍යාපන අමාත්‍යාංශය
06. ලේඛනාගාරය

## සමස්ත ලංකා පාසල් ගණිත තරගාවලිය

## සමස්ත ලංකා පාසල් ගණිත දැනුම මිනුම තරගාවලිය - 20……

(පළාත නියෝජනය කරන කණ්ඩායම පිළිබඳ තොරතුරු)

1. පළාත - ……………………………………
2. 

2.1 කණිෂ්ඨ අංශය (6,7,8 ශ්‍රේණි)
(සහතික පත්‍රයේ ලිවිය යුතු ආකාරය සම්පූර්ණ නම සහ පාසල නිවැරදිව සඳහන් කරන්න.)

| ශ්‍රේණි | ශිෂ්‍යයාගේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) | පාසල | අධ්‍යාපන කලාපය |
|---|---|---|---|
| 6 | | | |
| | | | |
| 7 | | | |
| | | | |
| 8 | | | |
| | | | |
| ආදේශ තරගකරුවන් | | | |
| 6 | | | |
| 7 | | | |
| 8 | | | |

2.2 ජ්‍යෙෂ්ඨ අංශය (9,10 ශ්‍රේණි)

| ශ්‍රේණි | ශිෂ්‍යයාගේ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) | පාසල | අධ්‍යාපන කලාපය |
|---|---|---|---|
| 9 | | | |
| | | | |
| | | | |
| 10 | | | |
| | | | |
| | | | |
| ආදේශ තරගකරුවන් | | | |
| 9 | | | |
| 10 | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

………………………………………………… ………………………
පළාත් ගණිත විෂය සම්බන්ධීකරණ නිලධාරී — දිනය
අත්සන හා නිල මුද්‍රාව

- පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය

පළාත් ගණිත විෂය සම්බන්ධීකරණ නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති උක්ත තොරතුරුවලට අදාළ කණ්ඩායම ජාතික තරගාවලිය සඳහා ඉදිරිපත් කිරීමට උචිත බව නිර්දේශ කරමි.

……………………………… ………………………
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ — දිනය
අත්සන හා නිල මුද්‍රාව

**කණිෂ්ඨ අංශය සහ ජ්‍යෙෂ්ඨ අංශය වශයෙන් ද, සිංහල සහ දෙමළ මාධ්‍ය වශයෙන් වෙන් වෙන් ව මෙම ආකෘති පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.**

| | |
|---|---|
| **කණිෂ්ඨ අංශය (සිංහල)** | |
| **කණිෂ්ඨ අංශය (දෙමළ)** | |
| **ජ්‍යෙෂ්ඨ අංශය (සිංහල)** | |
| **ජ්‍යෙෂ්ඨ අංශය (දෙමළ)** | |

අදාළ කොටුවේ පමණක් ✓ යොදන්න

**සමස්ත ලංකා පාසල් ගණිත තරගාවලිය**
**සමස්ත ලංකා පාසල් ගණිත නාට්‍ය තරගාවලිය - 20.......**
(පළාත නියෝජනය කරන කණ්ඩායම පිළිබඳ තොරතුරු)

1. පළාත - ..................................................... 1.1. කලාපය - ...........................................
2. පාසල - .....................................................
3. නාට්‍යයේ නම - .........................................
4. තරග අංශය - ............................................... 4.1. මාධ්‍ය - ..............................................
5. සහභාගී වන කණ්ඩායම -
   5.1 නාට්‍ය රංගන කණ්ඩායම
   සහතිකයට ඇතුළත් කිරීම පිණිස සම්පූර්ණ නම ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පැහැදිලි ව සටහන් කරන්න.

| | Full Name | Grade |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |
| 11 | | |
| 12 | | |
| 13 | | |
| 14 | | |
| 15 | | |

5.2 රංගන අවස්ථාවට සහභාගී නොවන පසුබිම් ගායන හා වාදන කණ්ඩායම

| | Full Name | Category Student / Teacher | If Student Grade |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |
| 6 | | | |
| 7 | | | |
| 8 | | | |
| 9 | | | |
| 10 | | | |

2 පිටුවට

6. තෝරාගත් ගණිත සංකල්ප මොනවා ද යන්නත් ඒවා නාට්‍ය සංදර්භය තුළ ඉදිරිපත් කෙරෙන ආකාරයත් සැකවින්
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................
.................................................................................................................................................

7. නාට්‍ය නිෂ්පාදනය පිළිබඳ තොරතුරු

   i. අධ්‍යක්ෂණය - ....................................................
   ii. අත්පිටපත් රචනය - ....................................................
   iii. සංගීතය - ....................................................
   iv. පසුතල නිර්මාණය - ....................................................
   v. ඇඳුම් නිර්මාණය - ....................................................

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරන අතර පළාත් තරගය මගින් තෝරාගන්නා ලද සමස්ත ලංකා තරගයට ඉදිරිපත් කිරීමට නියමිත <u>නාට්‍යයේ අත්පිටපත මේ සමඟ ඉදිරිපත් කර ඇති බව ද සහතික කරමි.</u>

............................................................ ..............................
පළාත් ගණිත විෂය සම්බන්ධීකරණ නිලධාරී දිනය
අත්සන හා නිල මුද්‍රාව

- **පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ සහතිකය**

පළාත් ගණිත විෂය සම්බන්ධීකරණ නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති ඉහත තොරතුරුවලට අනුව පළාතේ, කණිෂ්ඨ සිංහල/ කණිෂ්ඨ දෙමළ / ජ්‍යෙෂ්ඨ සිංහල /ජ්‍යෙෂ්ඨ දෙමළ (අනවශ්‍ය වචන කපාහරින්න) අංශය සඳහා පළාතේ ප්‍රථම ස්ථානය දිනූ, සහභාගිවන කණ්ඩායම ලෙස සඳහන් කණ්ඩායම විසින් ඉදිරිපත් කරනු ලබන මේ සමඟ ඇති නාට්‍ය අත්පිටපතට අයත් නාට්‍ය සමස්ත ලංකා ගණිත නාට්‍ය තරගාවලිය සඳහා ඉදිරිපත් කිරීමට උචිත බව නිර්දේශ කරමි. තව ද එම නාට්‍ය කණ්ඩායම ලෙස මෙහි අංක 5 යටතේ නම් කර ඇති කණ්ඩායමට අදාළ තොරතුරු නිවැරදි බව ද සහතික කරමි.

...................................... ................................
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ දිනය
අත්සන හා නිල මුද්‍රාව